---

**මදුරාවල ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 13 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මදුරාවල ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.

කර්මාන්ත ණයගැති හා ණයහිමි ලේඛන නොමැති වීම නිසා රු.3,282,162 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයද, රු.4,936,714 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂයද, බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපි නොමැති වීම නිසා රු.2,056,969 ක් වූ මුදල් ශේෂයද අදාල උපලේඛන නොමැති වීම නිසා රු.97,533 ක් වූ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂයද විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.2,278,368 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,945,212 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා/අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු මුදල් ගිණුමේ රු.2,052,967 ක මුදල් ශේෂයක් පැවති නමුත් එය කෙටිකාලීනව හෝ ආයෝජනය කිරීම කෙරෙහි සළකා බලා නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව පුනරාවර්තන වැය විෂයයන් 39 ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු.302,800 කින් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 11 ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු.9,260,500 කින් කිසිදු වියදමක් දරා නොතිබීමෙන් ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි වී තිබුණි.

(ඉ) පුනරාවර්තන වැය විෂයයන් 21 ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු.1,012,000 කින් රු.547,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර ඉතිරිය වූ රු.465,000 ක ප්‍රතිපාදනද වියදම් වී නොතිබුණි

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 1,444 | 1,688 | 586 |
| (ii.) | බදු කුලී | 70 | 23 | 288 |
| (iii.) | බලපත්‍ර ගාසතු | 311 | 303 | 8 |
| (iv.) | වෙනත් ආදායම් | 2,887 | 2,837 | -- |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 2,530,208 |
| මුද්දර ගාස්තු | 10,307,070 |

2.4 අවිධිමත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් වියදම එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 ඉක්මවන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා නොගෙන බල ප්‍රදේශයේ දහම් පාසැල් පුස්තකාල සඳහා පොත් ලබා දීම සහ බල ප්‍රදේශයේ පෙර පාසැල් සඳහා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.117,714 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි.

---

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ ප්‍රතිපාදන අනුමත වී තිබූ කටුහේන ලාවළුගහහේන මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම සභාවේ සෘජු ශ්‍රම පදනම මත ඉටු කර තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 අප්‍රේල් 09 දින සභාවේ තාක්ෂණ නිලධාරී සමඟ සිදු කළ භෞතික පරීක්ෂාවේදී මීටර් 75 ක අතුරා තිබූ කුට්ටි ගල් තැනින් තැන ගිලා බැස තිබූ බවත් (එක මට්ටමකට නොමැත) ගල් කැඩී තිබූ බවත් කුට්ටි ගල් මතුපිට සේදී ගොස් ඇතුළත ගල් මතුවී තිබූ බවත් නිරීක්ෂණය විය.

(ii) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 7 ප්‍රකාරව මාර්ගයේ දෙපස බාධකය මීටර් 110 ක් දිගට මීටර් 0.15 ක් පළලට 1:2:4 (¾”) මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීම සඳහා සිමෙන්ති මලු 60 ක් අවශ්‍ය වුවද 2012 ජූලි 19 දිනැති වැඩ නිමි වාර්තාව අනුව භාවිතා කර තිබුණේ සිමෙන්ති කොට්ට 43 ක් පමණි.

2:6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

2.6.1 <u>නිරවුල් නොවූ ගිණුම්</u>

2006 වර්ෂයේදී මදුරාවල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමේදී බුලත්සිංහල ප්‍රාදේශීය සභාවෙන් බෙදා දී තිබූ එකතුව රු.4,910,140 ක් වූ වත්කම් ශේෂ 16 ක් සහ එකතුව රු. 6,858,118 ක් වූ බැරකම් ශේෂ 14 ක් පදනම් කරගෙන ගිණුම් සකස් කර තිබුණද එම ශේෂ නිරවුල් කිරීමට / අයකර ගැනීමට විගණිත දිනය වූ 2013 අප්‍රේල් 10 වන විටත් පියවර ගෙන නොතිබුණි.

2.6.2 <u>ඉඩම් වෙන්දේසි කිරීම</u>

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් 1% ක ආදායමක් සභාව අයකර ගත යුතු වුවත් 2010, 2011 හා 2012 වර්ෂවල වෙන්දේසි කර තිබූ ඉඩම් 5 කින් සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් 1% ක් වශයෙන් රු.1,339,659 ක් අයකර ගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම් අනු බෙදුම් කර විකිණීමේදී පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර දී තිබූ ඉඩම්වල මායිම් වෙන් කර නොතිබුණි.

### 2.6.3 පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකශයට පත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරාදීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාව/-පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය ප්‍රකාරව පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්ෂේත්‍රයන් 13 ක් යටතේ පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබූ ආයතන 63 ක් සභාව විසින් හඳුනාගෙන තිබුණද ඒ සඳහා බලපත්‍ර ලබා දීමට විගණිත දිනය වූ 2013 අප්‍රේල් 09 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) පරිසර බලපත්‍ර ලබා දිය හැකි ක්ෂේත්‍ර 25 හි සඳහන් ක්‍රියාකාරකම් හා සම්බන්ධවන පරිසර දූෂණය වැලැක්වීම, අඩු කිරීම හා පාලනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත් එවැනි කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 2.6.4 සුසානභූමි

සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත් සුසානභූමි 24 ක් පවතින බව අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) සුසානභූමි 13 ක් සම්බන්ධයෙන් මැනුම් කටයුතු කර නොතිබුණි.

(ii) සුසානභූමි 6 ක් පවරා දීමට කටයුතු කරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇතත් විගණිත දිනය වන විටත් පවරා දී නොතිබුණි.

(iii) 636 කුඩායාල, මාබෝගොඩ, තුත්තිරිපිටිය අක්කර 2 ක් පමණ වූ පොදු සුසානභූමිය තුළ අනවසරයෙන් වගා කිරීම් කෙරගෙන යන බවත් 633, වේරවත්ත, දෙල්ගහකන්ද සුසානභූමිය අක්කර 1 ක පමණ ඉඩමේ අනවසර අල්ලාගැනීම් සිදු වී ඇති බවට පැමිණිලි ලැබී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 2.6.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතිවල 203 ජේදය අනුව සභාවේ දේපල සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක්ද 217 අනුව සියළුම ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

### 2.6.6 <u>හියුම් පයිප්ප නිෂ්පාදනය හා අලෙවිය</u>

2010, 2011 හා 2012 වර්ෂයන්හි අයවැය මගින් සභා කර්මාන්ත සඳහා අවශ්‍ය වන හියුම් පයිප්ප නිෂ්පාදනය කිරීමත් 2012 වර්ෂයේදී හියුම් පයිප්ප අලෙවි කිරීම තුළින් ආදායම් උත්පාදනය කිරීමටත් යෝජනා සම්මත කරවාගෙන තිබුණි. 2012 වර්ෂයේදී මෙසේ සභා කර්මාන්ත වෙනුවෙන් හා අලෙවිය වෙනුවෙන් නිෂ්පාදනය කර තිබූ හියුම් පයිප්ප සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඇතුළත විෂ්කම්භය අඩි 2, අඩි 1.5, අඩි 1 සහ ඝණකම අඟල් 2 ක් වන හියුම් පයිප්ප පිළිවෙලින් 25 ක්, 120 ක් හා 80 ක් වශයෙන් එකතුව පයිප්ප 225 ක් නිෂ්පාදනය කිරීමට 2012 ජනවාරි 17 දින රු.477,660 ක මුදලක් ඇස්තමේන්තු කර ඇතත් අමුද්‍රව්‍ය මිල අධික බව සඳහන් කරමින් අවසානයේ ඉහත අමුද්‍රව්‍ය පිරිවැය යටතේම 2012 දෙසැම්බර් 24 දින වනවිට අඩි 2 හියුම් පයිප්ප එකකුත්, අඩි 1.6 හියුම් පයිප්ප 24 කුත්, අඩි 1 හියුම් පයිප්ප 11 කුත් වශයෙන් එකතුව හියුම් පයිප්ප 36 ක් පමණක් නිපදවා තිබුණි. ඒ අනුව හියුම් පයිප්ප නිෂ්පාදනයේ අපේක්ෂිත ඉලක්කයට ළඟාවීම පිළිවෙලින් සියයට 4, සියයට 20, හා සියයට 14 තරම් වූ අඩු අගයක් ගෙන තිබූ බැව් නිරීක්ෂණය විය.

(ii) 2012 වර්ෂයේ සභාවේ කිසිදු කර්මාන්තයක් සඳහා මෙම හියුම් පයිප්ප භාවිතා කර නොතිබූ අතර විගණිත දිනය වූ 2013 අප්‍රේල් 05 වන විටත් භාවිතයට ගෙන තිබුණේ අඩි 1.6 හියම් පයිප්ප 14 ක් පමණි. ඒ අනුව හියුම් පයිප්ප අලෙවි කිරීමක් සිදු වී නොතිබූ අතර කර්මාන්ත සඳහා භාවිතා කිරීම ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.6.7 <u>කලායතන සඳහා සංගීත උපකරණ බෙදාදීම</u>

2012 වර්ෂයේ අයවැය යෝජනාවක් වශයෙන් ක්‍රියාවට නංවා තිබූ බල ප්‍රදේශයේ කලායතන සඳහා සංගීත උපකරණ බෙදාදීමේ වැඩසටහන යටතේ රු.193,210 ක් වැය කර විවිධ සංගීත භාණ්ඩ හා තෙල්මේ ඇදුම් කට්ටලයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 ඉක්මවන්නේ නම් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව දක්වා ඇතත් ඉහත භාණ්ඩ මිලදී ගෙන බෙදාදීම වෙනුවෙන් එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

---

(ආ) කලායතන 2 කට සංගීත භාණ්ඩ වර්ග 05 ක් සහ තෙල්මේ ඇඳුම් කට්ටලයක් භාර දී ඇති බව ලේඛනයේ සටහන් කර තිබුණද ඒවා භාරගත් බවට ලිඛිත සාක්ෂි නොතිබු අතර එම අයිතම 2013 අප්‍රේල් 05 දින සිදු කළ භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකෙරුණි.

2.6.8 **<u>කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය කිරීම</u>**

අලෙවි කිරීමට සහ සභාව සතු සුසාන භූමිවල සහ පොදු ඉඩම්වල මායිම් වැට සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් කණු නිපදවීමට 2011 සහ 2012 වර්ෂවලදී අයවැය යෝජනා ලෙස සම්මත කරගෙන තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.499,294 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. 2012 දෙසැම්බර් 24 දින වන විට රු.33,493 ක මුදලක් වැය කර කම්බි කණු 100 ක් නිෂ්පාදනය කර තිබුණි. නමුත් විගණිත දිනය වූ 2013 අප්‍රේල් 05 දින වන විටත් මෙ කම්බි කණු කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව සභා පරිශ්‍රයේ තිබුණි.

**3. පද්ධති හා පාලන**

----------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) අයවැයකරණය